සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය - 2025

8 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකය:

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියා දක්වන්න.

01. අතීතයේ දී වියළි කලාපයේ ජනාවාස ව්‍යාප්තිය වේගවත් වූ නිසා වැඩි වන ජනගහනයට සාපේක්ෂව ................................................ වැඩි කිරීම ප්‍රධාන අභියෝගයක් විය. (වැව් ඉදිකිරීම / වී වගාව / ආහාර නිෂ්පාදනය)

02. අනුරාධපුරයේ තිසාවැව ................................................ රජු විසින් ඉදිකරන ලදී. (පණ්ඩුකාභය / වසභ / දේවානම් පියතිස්ස)

03. පරාක්‍රම සමුද්‍රය I වන පරාක්‍රමබාහු රජතුමා විසින් ................................ ඉදිකර ඇත. (අනුරාධපුරයේ / පොළොන්නරුවේ / දඹුල්ලේ)

04. විශාල වැව් තැනවීම නිසා අතීතයේ දී ................................ පාලනය කරගත හැකි වීම ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණයකි. (ජලය / කෘෂිකර්මය / ගංවතුර)

05. වැවේ ජල ධාරිතාවේ පීඩනයට ඔරොත්තු දෙන පරිදි ................................ තැනවීම පැරණි වාරි ශිල්පීන් මුහුණ දුන් ප්‍රධාන අභියෝගයකි. (සළපනාව / බිසෝකොටුව / වැව් බැම්ම)

- අංක 06 - 10 තෙක් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. වැවට ජලය ලබාගැනීමට හා පිටකිරීමට පිටවාන සකසා තිබුණි. (   )

07. ජලය රඳවා තබාගැනීමට ඇළ දොළ, ගංගා හරහා බැඳ ඇති බැම්ම වේල්ලකි. (   )

08. ඇළ මාර්ග ඉදිකිරීමේ තාක්ෂණයේ දියුණුව පෙන්වන ආළිසාර ඇළ වසභ රජුගේ නිර්මාණයකි. (   )

09. අමුණක සිට වැවකට හෝ වැව් පද්ධතියකට ජලය ගෙන යාමට ඇළ මාර්ග ඉදිකර තිබුණි. (   )

10. බිම් මැනීම පිළිබඳ අතීත ලාංකිකයෝ සතුව පැවති විශිෂ්ට දැනුම පෙන්වූ අවස්ථාවක් ලෙස තල්වතු ඇළ දැක්විය හැකි ය. (   )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11. අවශ්‍යතා කිහිපයක් එකම පොකුණකින් ඉටුකරගනු ලැබීම අතීත ලංකාවේ පොකුණුවල ලක්ෂණයකි. එවැනි පොකුණකට උදාහරණයක් වන්නේ,
    (1) අභයගිරි ඇත් පොකුණ
    (2) අනුරාධපුර කුට්ටම් පොකුණ
    (3) පොළොන්නරුවේ නෙළුම් පොකුණ
    (4) පොළොන්නරුවේ කුමාර පොකුණ

12. අතීත ජල උද්‍යාන අතර රන්මසු උයනේ විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
    (1) අලංකාරය සඳහා තනවා තිබීම.
    (2) මනාව සැලසුම් කළ රාජකීය උද්‍යානයක් වීම.
    (3) පරිසරය සිසිල් කිරීමට තැනවීම.
    (4) ජල ක්‍රීඩා කිරීමට පමණක් උපයෝගී කර ගැනීම.

13. අතීතයේ මැටි භාණ්ඩ තැනීමේ දී සකපෝරුව භාවිත කරන ලද්දේ මින් කවර කරුණක් සඳහා ද?
(1) මැටි භාණ්ඩ මත මෝස්තර ඇඳීමට
(2) මැටි භාණ්ඩ විවිධ වර්ණ ගැන්වීමට
(3) විවිධ හැඩයන් අනුව විශාල මැටි භාණ්ඩ තැනීමට
(4) හැඩය හා ස්වරූපය අනුව වඩා හොඳ නිමාවකින් යුතු මැටි භාණ්ඩ තැනීමට

14. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කැණීම්වලින් හමුවන ද්‍රව්‍ය අතර වැඩි ප්‍රමාණයක් මින් කවර නිර්මාණයන් වේ ද?
(1) ගල් (2) වැලි (3) මැටි (4) ලෝකඩ

15. මෙරට ගඩොල් භාවිතය පැවති බවට සාක්ෂි හමුවන්නේ මින් කවර කාලයක සිට ද?
(1) ක්‍රි.පූ. 3 වන සියවස (2) ක්‍රි.පූ. 1 වන සියවස
(3) ක්‍රි.ව. 521 සිට (4) ක්‍රි.පූ. 10 වන සියවස

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස් තැන මත ලියන්න.**

16. ශිලා ලිපිවල .................................. ලෙස ලෝහ කර්මාන්තයේ නියැළුණු තැනැත්තකු හඳුන්වා ඇත.

17. රන් කර්මාන්ත ශාලාවක් පැවති බවට නටබුන් හමුවී තිබෙන්නේ .................................. භූමියේ පොකුණක් කැණීම් කිරීමේ දී ය.

18. පොළොන්නරු යුගයේ දී ඉදිවූ .................................. වෙහෙර නිශ්ශංකමල්ල රජුගේ නිර්මාණයකි.

19. දාගැබ් වටා ගල් කණු පේළි ලෙස සිටුවා ඒ මත ඉදිකරන ලද කෝණාකාර වහල .................................. ලෙස හැඳින්විණි.

20. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි .................................. බෝධිඝරය රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක නිර්මාණයකි. (ල. 2 x 20 = 40)


## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අංක 02 - 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

01. (1) (i) මෙම චිත්‍ර දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයක ද? (ල. 02)
(ii) මේවා නිර්මාණය කරන ලද්දේ කුමන සියවසක ද? (ල. 01)
(iii) මෙම චිත්‍ර සම්ප්‍රදාය වැඩිදියුණු වූයේ කවර යුගයේ ද? (ල. 01)
(iv) මෙවැනි චිත්‍ර දැකිය හැකි තවත් ස්ථාන 2 ක් ලියන්න. (ල. 02)



(2) (i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ල. 01)
(ii) එය පවතින්නේ කුමන ස්ථානවල ද? (ල. 01)
(iii) මෙහි පවතින කැටයම්වලින් නිරූපණය වන ඈ දෙකක් ලියන්න. (ල. 02)
(iv) පොළොන්නරු යුගය වන විට මෙම නිර්මාණයේ ඇති වූ වෙනස දක්වන්න. (ල. 01)




(3) (i) මෙහි දක්නට ලැබෙන නිර්මාණ 2 ක් දක්වන්න. (ල. 02)

(ii) මේවා පවතින්නේ ගොඩනැගිලිවල කිනම් ස්ථානවල ද? (ල. 01)

(iii) මේවා නිර්මාණය කර ඇත්තේ කුමන මාධ්‍යයකින් ද? (ල. 01)

(iv) මෙම මාධ්‍යයෙන් ම නිර්මාණය කර ඇති තවත් නිර්මාණයක් සඳහන් කරන්න. (ල. 01)



02. (1) වැවක ප්‍රධාන අංග 4 ක් දක්වන්න. (ල. 02)

(2) ඉන් දෙකක් මගින් ඉටුකෙරෙන කාර්යයන් ලියන්න. (ල. 04)

(3) පැරැන්නෝ වැව් නිර්මාණයේ දී මුහුණ දුන් අභියෝග 3 ක් දක්වන්න. (ල. 03)

(4) විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණ 2 ක් දක්වන්න. (ල. 02)

03. (1) වේලි බැඳීමේ තාක්ෂණය අනුව ඉදිකළ තාවකාලික වේලි හා ස්ථාවර වේලි යනු මොනවාදැයි දක්වන්න. (ල. 04)

(2) පැරැන්නෝ තනවන ලද ඇළ මාර්ග සම්බන්ධයෙන් පවතින කරුණු අනුව මෙම වගුව සම්පූර්ණ කරන්න. (ල. 07)

| ඇළ මාර්ගයේ නම | ඉදිකළ රජු | ඉදිකළ ගංගාව | ජලය ගෙනගිය ස්ථානය |
|---|---|---|---|
| 1. ඇළහැර ඇළ | .................... | .................... | මින්නේරිය වැව |
| 2. .................... | .................... | .................... | තිසාවැව |
| 3. මිනිපේ ඇළ | .................... | .................... | රජරට ප්‍රදේශයට |

04. අතීත ජනයාගේ පොකුණු තැනවීමේ තාක්ෂණය හා පොකුණු වර්ග අනුව පහත සටහන සම්පූර්ණ කරන්න.

(1) පොකුණු වර්ගය

(2) උදාහරණය


(3) විශේෂ ලක්ෂණය

(ල. 11)

පොකුණු වර්ග

| | | | | |
|---|---|---|---|---|
| (1) | .................... | .................... | .................... | .................... |
| (2) | .................... | .................... | නෙළුම් පොකුණ | .................... |
| (3) | .................... | .................... | .................... | .................... |

05.



A B C

(1) A, B හා C රූපවලින් දැක්වෙන නිර්මාණ දක්වන්න. (ල. 03)

(2) A හා B නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණ 2 බැගින් දක්වන්න. (ල. 04)

(3) C රූපයේ දැක්වෙන නිර්මාණය නිසා ඇතිවන වාසි 2 ක් දක්වන්න. (ල. 04)

06. (1) අතීතයේ පහත සඳහන් නිෂ්පාදන පැවති බවට සාධක 2 බැගින් දක්වන්න.

* උළු හා ගඩොල් නිෂ්පාදනය
* මැටි තාක්ෂණය
* ලෝහ තාක්ෂණය

(ල. 06)

(2) මෙම නිෂ්පාදන සකස් කිරීම සඳහා අනුගමනය කළ පියවර ලෝහ තාක්ෂණය හා උළු, ගඩොල් නිෂ්පාදනය ඇසුරින් පහත වගුවේ දක්වන්න. (ල. 05)

| ලෝහ තාක්ෂණය | උළු ගඩොල් නිෂ්පාදනය |
|---|---|
| 1. යකඩ අඩංගු ස්වභාවික ගල් සොයාගැනීම | 4. සුදුසු මැටි තෝරා පදම්කිරීම |
| 2. ........................................ | 5. ........................................ |
| 3. ........................................ | 6. ........................................ |
| | 7. ........................................ |

07. (1) අතීතයේ ලංකාවේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ බොහොමයක් භාවිත කරන ලද අංග දෙක දක්වන්න. (ල. 02)

(2) අතීත ගෘහ නිර්මාණ පිළිබඳ ව පහත වගුවේ සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න. (ල. 09)

ගෘහ නිර්මාණ

(1) ........................................

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

(2) ආගමික නොවන ගොඩනැගිලි

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................

## I - කොටස

01. ආහාර නිෂ්පාදනය 02. දේවානම් පියතිස්ස 03 පොළොන්නරුවේ
04. ගංවතුර 05. වැව් බැම්ම 06. × 07. ✓ 08. ✓ 09. ✓ 10. ×
11. 2 12. 3 13. 4 14. 3 15. 1 16. කබර, තඹර, තොපළු
17. අභයගිරි 18. රන්කොත් වෙහෙර 19. චෛතියඝර 20. තිල්ලක්කගම

(ලකුණු 40)

## II කොටස

01. (1) (i) පුල්ලිගොඩ ගල්ලෙන (ල. 02) (ii) ක්‍රි.ව. 5 සියවස (ල. 01) (ල. 04)
(iii) පොළොන්නරු යුගයේ (ල. 01)
(iv) දිඹුලාගල, පොළොන්නරු ගල් විහාරය, සීගිරිය (ල. 02)
(2) (i) සඳකඩ පහණ (ල. 01) (ii) ගොඩනැගිලි ප්‍රවේශ දොරටු ඉදිරියේ (ල. 01)
(iii) සුදුසු පරිදි දැක්වීමට (ල. 02) (iv) වෘෂභ රූපය ඉවත් වීම (ල. 01)
(3) (i) මුරගල්, කොරවක් ගල්, පියගැට (ල. 02) (ii) ගොඩනැගිලි ප්‍රවේශ දොරටු සඳහා (ල. 01)
(iii) ගලින්, පාෂාණ (ල. 01)
(iv) ඉසුරුමුණියේ පෙම් යුවළ, අශ්ව හිස හා මිනිසා (ල. 01) (මුළු ලකුණු 16)

02. (1) අංග දැක්වීමට (ල. 02) (2) කාර්යයන් දැක්වීමට (ල. 04)
(3) වැවේ ජල ධාරිතාවට ඔරොත්තු දෙන ලෙස බැම්ම සැකසීම / ශ්‍රමය සපයා ගැනීම / උචිත ස්ථානය තෝරාගැනීම / උසස් ප්‍රමිතිය (ල. 03)
(4) වැඩි ජල ධාරිතාවක් ගබඩා කරගත හැකි වීම. / ජල හිඟය අවම කර ගැනීම / ගංවතුර පාලනය / දිගු ඇළ මාර්ග තැනීම / කුඩා ජලාශ හා වැව්වලට ජලය සැපයීම (ල. 02)

03. (1) සුදුසු පරිදි දැක්වීම (ල. 04) (2) සුදුසු පරිදි දැක්වීම (ල. 07)

04.

පොකුණු වර්ග

| ජල පරිභෝජනය සඳහා | වැසි ජලය බැස යාමට | අලංකාරය සඳහා | සිසිල් කිරීම සඳහා |
|---|---|---|---|
| ↓ | ↓ | ↓ | ↓ |
| අභයගිරිය ඇත් පොකුණ<br>රන්මසු උයනේ පොකුණු | අභයගිරි දාගැබට සිව් දෙසින් තනවා ඇති පොකුණු | පොළොන්නරුවේ කුමාර පොකුණ<br>නෙළුම් පොකුණ | රජගල පොකුණ<br>අභයගිරි විහාර භූමියේ පොකුණ |
| ↓ | ↓ | ↓ | ↓ |
| ස්නානය<br>පානීය ජලය<br>ජල ක්‍රීඩා කිරීම | පරිසර ගැටලු අවම වීම<br>උමං හෝ මතුපිට කානු<br>දාගැබ් හා ආරාම ආශ්‍රිත ව දක්නට ලැබීම | අලංකාර<br>සැරසිලි පැවතීම | එක් ප්‍රදේශයක ළඟ ළඟ පොකුණු සෑදීම<br>ජල වාෂ්ප නිසා පරිසරය සිසිල් වීම |

05. (1) A රන්මසු උයන
B සීගිරි ජල උද්‍යානය
C කුට්ටම් පොකුණ (ජල පෙරනය) (ල. 03)
(2) ලක්ෂණ දැක්වීමට (ල. 04)
(3) රොන්මඩ හා අපද්‍රව්‍ය එකතුවීම වැළැක්වීම / ජලය සෘජු ව ම පොකුණට යොමු නොකිරීම / පොකුණේ ජලය අපවිත්‍රවීම වැළැක්වීම (ල. 04)

06. (1) සටහන දැක්වීමට (ල. 06)
(2) 1. ලෝහ තාක්ෂණය
2. මැටියෙන් තැනූ උදුන්වලට දැමීම
3. අවශ්‍ය උෂ්ණත්වය හිත්තෙන් ලබාදීම, ස්වභාවික සුළං බලය මගින් ගිනි දැල්වීමට සකස් කිරීම, යකඩ නිස්සාරණය කර ගැනීම,
4. උළු ගඩොල් නිෂ්පාදනය
5. උළු අච්චුවේ යොදාගැනීම
6. උළුවල හැඩය සකසා ගැනීම
7. උළු වියළීම / උළු පිලිස්සීම ආදිය

07. (1) ආගමික කටයුතු සඳහා භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා (ල. 02)
(2) උදාහරණ දැක්වීමට (ල. 09)